මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: NP/RD/DCB 2026
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.01.16

මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ: MF/02/2026

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

## විමධ්‍යගත අයවැය වැඩසටහන - 2026

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් රටේ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණ ඇතිව නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම තීරණාත්මක සහ ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත. තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් අත්පත් කරගැනීම අරමුණු කර ගනිමින් මෙම නිෂ්පාදන ආර්ථිකය ගොඩනැගීම සඳහා උපායමාර්ගික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් සහ වගවීමෙන් ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම මෙම වැඩසටහනේ අපේක්ෂාවයි.

ඒ අනුව, ස්වයංපෝෂිත ආර්ථිකයක් නිර්මාණය කිරීම, අපනයන විවිධාංගීකරණය කිරීම, ආනයන ආදේශන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම, ඵලදායි ආර්ථික කටයුතුවල නියැලීමට හැකිවන පරිදි ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම, සංචාරක කර්මාන්තය දියුණු කිරීම, රැකියා උත්පාදනය සහ ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිකිරීම යන රජයේ මූලික සංවර්ධන ඉලක්ක යථාර්ථයක් බවට පත්කර ගැනීම සඳහා 2026 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

ඉහත සංවර්ධන ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරමින්, 2026 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 10 කි.

මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාළ වැය ශීර්ෂය යටතේ ලබාදීමට කටයුතු කරනු ඇත. ඒ අනුව, වෙනත් අරමුදල් මූලාශ්‍රයකින් ආවරණය නොවන මෙම චක්‍රලේඛයේ 1 ඡේදය යටතේ සඳහන් සංවර්ධන අංශ යටතේ හඳුනා ගනු ලබන, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථව ආයෝජනය කරනු ලබන බවට වග බලා ගැනීම ඔබ වෙත පැවරෙන වගකීමකි.

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම වඩාත් පහසු කිරීම උදෙසා පහත සඳහන් මාර්ගෝපදේශයන් නිකුත් කෙරේ.

## 1. ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා සංවර්ධන අංශ

1.1 විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීමේ දී පහත සංවර්ධන අංශ වෙත අවධානය යොමු කළ යුතුය.

අංකය සංවර්ධන අංශය

1. කෘෂි, සත්ත්ව. ධීවර අංශයේ සංවර්ධන ව්‍යාපෘති.
නිෂ්පාදන විවිධාංගීකරණ ව්‍යාපෘති, අගය එකතු කිරීමේ ව්‍යාපෘති, කමත් සංවර්ධනය, ට්‍රැක්ටර් පැන්නුම් සකස් කිරීම, වන සතුන්ගෙන් ජන ජීවිතයට හා ගොවි බිම්වලට එල්ලවන උවදුරු අවම කිරීම සඳහා වන ව්‍යාපෘති, සාමූහිකව භාවිතා කළ හැකි කෘෂිකාර්මික ප්‍රාග්ධන උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ලියාපදිංචි සහ ක්‍රියාකාරී ගොවි සංවිධාන වෙත ලබා දීම, පශු සම්පත් සංවර්ධනය, සාමූහික ගොවිපොළ සංවර්ධනය, ධීවර වරායන්හි රේඛීය අමාත්‍යාංශ මට්ටමින් ආවරණය නොවන යටිතල පහසුකම් සංවර්ධනය, මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා වන යෝජනා, ධීවර තොටුපොළ සංවර්ධනය.

2. සුළු වාරිමාර්ග ඇතුළු නිෂ්පාදන ආර්ථිකයක් සඳහා පාදක වන ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති.
කුඩා ප්‍රමාණයේ වැව් පිළිසකර කිරීම, ඒවායෙහි ධාරිතාවය වැඩිකිරීම, ඇළවේලි, අමුණු, වෙනත් ජල බස්නා ස්ථාන, ජල හා පොකුණු, කෘෂි ළිං, නළ ළිං, ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

3. ආනයන ආදේශන කර්මාන්ත සහ දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරමින් සිදුකරනු ලබන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා වන ව්‍යාපෘති.
ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික දැනුම ලබා දීම. නිෂ්පාදන ගම්මාන සංවර්ධන ව්‍යාපෘති, දේශීය දියර කිරි නිෂ්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘති, කඩමණ්ඩි, සතිපොළ, අලෙවි මධ්‍යස්ථාන, ගබඩා පහසුකම්, ශීතාගාරයන්හි භෞතික පහසුකම් හෝ ඒවායෙහි සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘති.

4. නිෂ්පාදන ආර්ථිකයක් සඳහා පාදක වන අනිකුත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
රැකියා උත්පාදන ව්‍යාපෘති, ජීවනෝපාය සංවර්ධන පොදු ව්‍යාපෘති, නිෂ්පාදන ප්‍රවාහනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

5. සංචාරක ආකර්ශණීය ස්ථාන සංවර්ධනය සහ සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධන ව්‍යාපෘති.
යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, සංචාරක ඉලක්ක කර ගත් රජයට අයත් දේශීය ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සංචාරක අකර්ශණීය ස්ථාන වල පොදු සනීපාරක්ෂක පහසුකම්, ගිමන්හල් ඉදිකිරීම.

6. ග්‍රාමීය ප්‍රජා පානීය ජලසම්පාදන ව්‍යාපෘති.
ජල මූලාශ්‍ර පැහැදිලිව හඳුනා ගත යුතු අතර, රජයට ඉදිරියේදී වැය බරක් නොවන පරිදි නඩත්තුව සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

7. නිෂ්පාදන ආර්ථිකයක් සඳහා දායක වන මාර්ග සංවර්ධන ව්‍යාපෘති.
ග්‍රාමීය මාර්ග, කෘෂි මාර්ග, පියගැටපෙළවල්, බෝක්කු, ඒදඬු, යකඩ පාලම්, තැලවිලි (සපත්තු පාලම්), පෙට්ටි බෝක්කු, මාර්ග දෙපස කාණු පද්ධති ඉදිකිරීම හෝ නවීකරණය.

8. නිෂ්පාදන ආර්ථික කටයුතු සඳහා අවශ්‍ය ග්‍රාමීය හෝ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි විදුලි බල යෝජනා ක්‍රම
සුළු පරිමාන විදුලිය දීර්ඝ කිරීම, විදුලි ධාරිතාවය ඉහළ නැංවීම්, නිෂ්පාදන කටයුතු සඳහා පොදුවේ භාවිතා කරන මධ්‍යස්ථාන සඳහා විදුලි සම්බන්ධතා ලබා දීම.

9. විවිධ වැඩසටහන් යටතේ රජය විසින් මුදල් ආයෝජනය කර වැඩ ආරම්භ කර ඇතත්, විවිධ හේතූන් නිසා අත්හැර දමා ඇති හෝ අර්ධ වශයෙන් හෝ වැඩ නිම කර ඇති කුඩා ප්‍රමාණයේ ගොඩනැගිලි හෝ වසා දමා ඇති රජයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම,
විදුලිය, ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ ප්‍රවේශ මාර්ග සංවර්ධනය කර, ආර්ථික කටයුතු වලට විධිමත්ව යොදාගත හැකි නම් හා එම ආර්ථික කටයුතු සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් මේ වන විටත් හඳුනාගෙන ඇත්නම්, එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම හා පහසුකම් සංවර්ධනය කිරීම. මෙම ගොඩනැගිලි සම්පූර්ණ කළ විගසම යෝජිත ආර්ථික කටයුතු ආරම්භ කළ හැකි විය යුතු අතර, මේ සඳහා රාජ්‍ය හෝ රාජ්‍ය-පෞද්ගලික අංශයේ හවුල්කාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමුකළ යුතුය.

10. ස්වාභාවික ආපදා හේතුවෙන් පූර්ණ හෝ අර්ධ වශයෙන් විනාශයට පත්වූ යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම සහ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති.
වෙනත් අරමුදල් මූලාශ්‍රයකින් ආවරණය නොවන, ග්‍රාමීය හෝ ප්‍රාදේශීය මට්මමින් නිෂ්පාදන ආර්ථිකයට දායක වන ඵලදායි ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම.

## 1.2 ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ප්‍රමුඛතාගත කිරීම

ඉහත 1.1 යටතේ දක්වා ඇති අංක 1 සිට 10 දක්වාවූ සංවර්ධන අංශ යටතේ ව්‍යාපෘති හඳුනාගැනීමේදී මහජන නියෝජිතයින් විසින් හඳුනා ගන්නා ව්‍යාපෘති තෝරා ගත යුතු අතර, එම ව්‍යාපෘති පහත මූලාශ්‍ර ඇසුරෙන් හඳුනා ගැනීම තුළින් පරිපාලන ප්‍රමාදයන් අවම කර ගැනීමට ඉවහල් වන බවට එම මහජන නියෝජිතයින් දැනුවත් කළ යුතුය.

1.2.1 මේ වන විටත් සකස් කර ඇති ග්‍රාම සංවර්ධන සැලැස්ම
1.2.2 විවිධ ආයතන මගින් සකස් කර ඇති ග්‍රාමීය සංවර්ධන ප්‍රමුඛතා සහිත ලේඛණ (ඇත්නම්)
1.2.3 පොදු හා සාමූහික කාර්යයන් සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබා දීම හා තනි පුද්ගල ක්‍රියාකාරකම් සඳහා සෘජු ප්‍රදාන ලබා දීම් වලින් බැහැර වීම

## 2. ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම, අනුමත කිරීම, සහ ප්‍රතිපාදන නිදහස් කිරීම

2.1 ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කැඳවා මෙම ජාතික වැඩසටහන සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කැඳවීමේදී රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2025.09.01 දින "දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ප්‍රතිසංවිධානය" යන මැයෙන් නිකුත් කරන ලද ස්වදේශ කටයුතු 03/2025 චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

2.2 දිස්ත්‍රික්කයෙන් තේරී පත්වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තම ප්‍රතිපාදන සීමාව තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනා තම දිස්ත්‍රික්කයේ අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කල යුතුවේ. වන්නි මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා තේරී පත්වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වවුනියාව, මන්නාරම සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක සඳහාද යෝජනා ඉදිරිපත් කළ හැකි අතර, යාපනය මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා තේරී පත්වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යාපනය සහ කිළිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක සඳහාද යෝජනා ඉදිරිපත් කළ හැකිය.

2.3 ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වුන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තම ප්‍රතිපාදන සීමාව තුළ ඕනෑම දිස්ත්‍රික්කයක් සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ හැකි අතර, අදාළ යෝජනා ඒ ඒ දිස්ත්‍රික්කයන්ට අයත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කල යුතුවේ.

2.4 ව්‍යාපෘතියක අවම වටිනාකම රුපියල් ලක්ෂ 05 කි.

2.5 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ලබා දෙන සංවර්ධන යෝජනා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ගේ නිර්දේශ සහිතව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශයට යොමු කිරීම ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමකි. මෙහිදී, ව්‍යාපෘති නිර්දේශ කිරීමේදී එම ව්‍යාපෘති ඉහත අංක 1 ඡේදයේ සඳහන් නිර්ණායක වලට අනුකූල වන බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) සහ ප්‍රාදේශීය ලේකම් විසින් වගබලා ගත යුතුවේ.

2.6 ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය ලබා දීමේදී, ඉහත අංක 1 යටතේ සඳහන් සංවර්ධන අංශ යටතට අයත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින ස්වභාවික සම්පත්, අමුද්‍රව්‍ය, ආර්ථික කටයුතු සඳහා යොදා ගතහැකි භූමි ප්‍රමාණය, පාරිසරික තත්ත්ව, ජනතාවගේ ආර්ථික කටයුතු, ප්‍රදේශයට සුවිශේෂී වූ සංවර්ධන අවශ්‍යතා මෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ ආබාධිත ජනකණ්ඩායම් ආර්ථික ක්‍රියාවලියට දායක කර ගැනීමේ හැකියාව පිළිබඳ සැලකිල්ලට ගනිමින්, කඩිනමින් ජනතාවට ප්‍රතිලාභ හිමිවන සංවර්ධන අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

2.7 ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් නිර්දේශ කරනු ලබන යෝජනා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නොපමාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කළ යුතුය.

2.8 දිස්ත්‍රික් ලේකම්වරුන් එම යෝජනා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂකගේ නිර්දේශ සහිතව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කළ යුතුය. මෙහිදී, ව්‍යාපෘති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමේදී එම ව්‍යාපෘති ඉහත අංක 1 ඡේදයේ සඳහන් නිර්ණායක වලට අනුකූල වන බවට දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂක සහ දිස්ත්‍රික් ලේකම් විසින් තහවුරු කර ගත යුතුවේ.

2.9 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය සහිතව ඉදිරිපත් වන ව්‍යාපෘති අනුමත කිරීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඇති පෙර සූදානම, අනුමත ප්‍රතිපාදන සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමේ හැකියාව, කාලය, ආයතනික ධාරිතාවය, තාක්ෂණික කරුණු, කාලගුණික සහ දේශගුණික සාධක පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ යුතුය.

2.10 එසේම, එම ආයෝජනය මඟින්, ප්‍රාදේශීය සම්පත් උපයෝගීතාව, අගය එකතු කිරීම, වෙළඳපොළ, සැපයුම් ජාල, අගය දාම සංවර්ධනය, තිරසාරභාවය, පොදුවේ පරිහරණය කළ හැකිවීම, නඩත්තු කිරීමේ ක්‍රමවේදය, අමුද්‍රව්‍ය හිඟයකින් තොරව සපයාගැනීම, නිමැයුම සඳහා වන ඉල්ලුම, පාරිසරික සාධක, ආදායම් බෙදීයාම සහ රැකියා උත්පාදන ව්‍යාපෘතියක් නම්, නිශ්චිත වශයෙන් ජනනය කරන රැකියා ප්‍රමාණය, වැනි සාධක පිළිබඳවද අවධානය යොමුකළ යුතුය.

2.11 තවද, ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමට ප්‍රථම, ඉඩම් නිරවුල්භාවය, පොදුවේ පරිහරණය, යෝජිත ප්‍රතිලාභ අනාගතයේදී බාධාවකින් තොරව තිරසාරව පවත්වා ගත හැකි බව හා නඩත්තු කටයුතු සඳහා තව දුරටත් රජයට වැය බරක් නොවන පරිදි නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට සෑහීමකට පත්විය යුතුය.

2.12 මෙම වැඩසටහන යටතේ සිදුකරන සංවර්ධන ව්‍යාපෘති වෙනත් රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විවිධ දෙපාර්තමේන්තු මඟින් සිදුකරන වැඩසටහන් සහ ව්‍යාපෘති සමඟ ද්විකරණයක් සිදු නොවන බවට සහතික විය යුතුය.

2.13 ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කරමින්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් යොමුකරන සංවර්ධන යෝජනා අතරින් ඒ ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි, 2026 වර්ෂය තුල ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ඉහළ ප්‍රමුඛතාවයකින් සහ ශක්‍යතාවයකින් යුත් ව්‍යාපෘති අනුමත කළ යුතුය.

2.14 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කළ යෝජනා, දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරන යෝජනාවක් නම්, ඇමුණුම 1 හි සඳහන් ආකෘතිය මගින්ද, ජාතික ලැයිස්තුව මගින් තේරී පත්වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරන යෝජනාවක් නම්, ඇමුණුම 2 හි සඳහන් අකෘතිය මඟින්ද, ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් නොපමාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

2.15 ප්‍රතිපාදන ලද වහාම කාල පමාවකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීමකි.

## 3. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

3.1 2026 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වූ ව්‍යාපෘති යෝජනා 2026 දෙසැම්බර් මස 15 වන දිනට හෝ එදිනට පෙර අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වූ ව්‍යාපෘති යෝජනාවක් කිසියම් හේතුවක් මත සංශෝධනය කිරීමට සිදුවන්නේ නම්, එම සංශෝධනය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය මත, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියෙන් සිදු කළ යුතුය. එසේවුවද, එම යෝජනාව සඳහා ප්‍රතිපාදන නිවැරදි කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහිදී සංශෝධිත ව්‍යාපෘති නියම කරන ලද කාල සීමාව තුළ අවසන් කිරීමට ඇති හැකියාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

3.3 සියලුම ව්‍යාපෘති රජයේ අනුමත නීතිරීති, චක්‍රලේඛ, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක වන බවට දැඩිසේ වගබලා ගත යුතුය.

3.4 සංවර්ධන ව්‍යාපෘති, අංක 2412/01 දරණ 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 අනුව කටයුතු කරන බවට සහතික විය යුතුය.

3.5 පෙර වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂයේදීත් විමධ්‍යගත අයවැය වැඩසටහන හා ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේ කාර්යය සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ යටතේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. මෙම කාර්යය සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රමසම්පාදන අංශයට අනුයුක්ත නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් (ක්‍රමසම්පාදන) අනුයුක්ත කිරීමට පියවර ගත යුතුය.

3.6 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, ඒ සඳහා නිශ්චිත කාල රාමුවක් සකස් කරගත යුතු අතර, ප්‍රාදේශීය ලේකම්ගේ සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් (ක්‍රමසම්පාදන) ගේ මඟපෙන්වීම යටතේ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් භාර ආර්ථික සංවර්ධන නිලධාරීන් වෙත නිසි වගකීම් පැවරිය යුතුය.

## 4. විමධ්‍යගත අයවැය වැඩසටහන ප්‍රදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදය

4.1 2026 විමධ්‍යගත අයවැය වැඩසටහනේ ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක මට්ටමේ ප්‍රගතිය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල න්‍යාය පත්‍රයන්ට ඇතුළත් කොට, ප්‍රාදේශිය සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය.

4.2 තවදුරටත්, ප්‍රාදේශීය මට්ටමේ ප්‍රගතිය, එනම් ව්‍යාපෘති සකස් කර ඇති නිශ්චිත කාල රාමුව අනුව ක්‍රියාත්මක වීම සතිපතා සමාලෝචනය කිරීම සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ යටතේ නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය. එහිදී, දිස්ත්‍රික් ලේකම් විසින් අවශ්‍යතාවය පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

4.3 මෙම සමස්ත වැඩසටහන ජනාධිපති ලේකම් කාර්යාලය මගින් අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රගතිය සහ අවශ්‍ය තොරතුරු ඔබ වෙතින් ලබාගෙන ජනාධිපති ලේකම් කාර්යාලය වෙත විටින් විට සපයනු ඇත. ඒ සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරියේ දී නිකුත් කරනු ඇත. ඒ අනුව මෙම වැඩසටහනේ ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.

4.4 මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා සුදුසු ඩිජිටල් යෙදවුමක් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සකස් කිරීමට අවධානය යොමු කෙරේ.

## 5. වෙනත් කරුණු

5.1 ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා එක් එක් ව්‍යාපෘතියේ වටිනාකමින් 2% කට නොවැඩි ප්‍රතිපාදනයක් සහ ඉදිකිරීමක් නොවන ව්‍යාපෘති සඳහා 0.5% කට නොවැඩි ප්‍රතිපාදනයක් පරිපාලන වියදම් ලෙස වෙන් කළ හැකි අතර එය පහත පරිදි උපයෝජනය කළ යුතුය. (සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාළ පරිපාලන පිරිවැයද ඊට ඇතුළත් කළ යුතුය. එසේ වුවද, පරිපාලන වියදම දැරිය යුත්තේ සත්‍ය වශයෙන්ම ව්‍යාපෘතිය නිම කිරීමෙන් හා ඒ සඳහා ගෙවීම් කිරීමෙන් අනතුරුවය).

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආශ්‍රිත කටයුතු සඳහා 25% උපරිමයකට යටත්ව

(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ක්‍රියාත්මක කරන ආයතන ආශ්‍රිත කටයුතු සඳහා 75% උපරිමයකට යටත්ව

5.2 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවලට අනුයුක්ත තාක්ෂණික නිලධාරීන් සහ තාක්ෂණික සහායක නිලධාරීන්ගේ සේවය උපරිම අයුරින් දායක කර ගත යුතුය.

5.3 මෙම වැඩසටහන යටතේ 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් හඳුනාගත යුතුය. අසම්පූර්ණ ව්‍යාපෘති හෝ අදියර වශයෙන් ක්‍රියාත්මක ව්‍යාපෘති තෝරා නොගත යුතුය. සෑම ව්‍යාපෘතියක්ම එම ව්‍යාපෘතිය නිම කළ වහාම ජනතාවට ප්‍රතිලාභ අත්වන සේ ක්‍රියාත්මක කළ යුතුය. මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 2026 වර්ෂයෙන් ඉදිරියට අවිච්ඡේද කිරීම කිසිදු අයුරකින් නොකළ යුතුය.

5.4 විමධ්‍යගත අයවැය වැඩසටහන 2026 මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට සිදුවන සියලුම ආකාරයේ බදු හා වෙනත් ගෙවීම් මෙම වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිපාදන තුළින් කළමණාකරනය කර ගත යුතු වන අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොකෙරේ.

5.5 ව්‍යාපෘති සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා පමණක් යොදවා ගත යුතුය. ව්‍යාපෘති ඇස්තමේන්තු තුළ නාම පුවරු සකස් කිරීම් වැනි වියදම් ඇතුළත් නොකළ යුතුය.

5.6 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඔබ සහ ඔබ යටතේ සිටින සියලුම නිලධාරීන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ අපක්ෂපාතීව, සාධාරණව හා විනිවිදභාවයෙන් යුතුව සමීපව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5.7 මෙම චක්‍රලේඛයේ යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වෙතොත්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රියන්ජිත් අබේසේකර මහතා (011-2484783 / 0718610488) සම්බන්ධ කර ගත හැක.

මෙම චක්‍රලේඛයේ අන්තර්ගතය පිළිබඳව ඔබගේ දිස්ත්‍රික්කයේ සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් කඩිනමින් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
ලේකම්

පිටපත් -
1. සියලුම ගරු පාර්ලිමේන්ත්‍ර මන්ත්‍රීතුමන්ලා - මෙම චක්‍රලේඛයට අනුව හඳුනාගන්නා ව්‍යාපෘති යෝජනා කඩිනමින් අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත යොමු කිරීම සඳහා
2. පළාත් ආණ්ඩුකාරවරු -කාරුණික දැන ගැනීම පිණිස
3. සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු - කාරුණික දැන ගැනීම පිණිස
4. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
5. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
6. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස
7. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම පිණිස
8. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම පිණිස
9. ලේකම්, මුදල් කොමිෂන් සභාව - කාරුණික දැනගැනීම පිණිස
10. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
11. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
12. අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
13. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව- කාරුණික දැනගැනීම හා අ.ක.ස
14. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස
15. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස

# ගරු දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් සඳහා ප්‍රතිපාදන ඉල්ලීම

විමධ්‍යගත අයවැය වැඩසටහන - **2026**

**ඇමුණුම 1**

අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රතිපාදන ඉල්ලීම

දිස්ත්‍රික්කය-

ව්‍යාපෘතිය ඉදිරිපත් කරනු ලැබූ ගරු මන්ත්‍රීවරයාගේ නම -

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාලය | ව්‍යාපෘතිය අයත්වන සංවර්ධන අංශය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ව්‍යාපෘති වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| මුළු එකතුව (රු.) | | | | | | |

අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
අත්සන හා නිල මුද්‍රාව

දිස්ත්‍රික් ලේකම්
අත්සන හා නිල මුද්‍රාව

# ජාතික ලැයිස්තු ගරු මන්ත්‍රීවරුන් සඳහා ප්‍රතිපාදන ඉල්ලීම

විමධ්‍යගත අයවැය වැඩසටහන - **2026**

ඇමුණුම **2**

අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රතිපාදන ඉල්ලීම

දිස්ත්‍රික්කය-

ව්‍යාපෘතිය ඉදිරිපත් කරනු ලැබූ ගරු මන්ත්‍රීවරයාගේ නම -

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාලය | ව්‍යාපෘතිය අයත්වන සංවර්ධන අංශය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ව්‍යාපෘති වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| මුළු එකතුව (රු.) | | | | | | |

අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
අත්සන හා නිල මුද්‍රාව

දිස්ත්‍රික් ලේකම්
අත්සන හා නිල මුද්‍රාව